සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2213

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.............................................................. විභාග අංකය:-.................................................................

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 5 දක්වා දී ඇති කරුණු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

  (සංගීත, තබ්ලාව, රබන්, එස්රාජය, නර්තන, ස්වර)

01. නිවැරදි විශිෂ්ට ගායනයක් ඉදිරිපත් කිරීමට ......................................... අභ්‍යාස පුහුණුව ඉතා වැදගත් වේ.

02. නාදය ......................................... විෂයයේ මාධ්‍යයයි.

03. ..................................... තත් වාද්‍ය භාණ්ඩයකි.

04. බායාං සහ දායාං යන කොටස් දෙකින් යුතු භාණ්ඩය ......................................... යි

05. "තෙලෙන් බැද්දත් කොබෙයියා" යන ..................................... පදය ඇසුරෙන් "තෝව දෙන්නෙත් නරියටයි." යන ගීතය නිර්මාණය වී ඇත. (ලකුණු 2 x 5 = 10)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ වරහන් තුළ යොදන්න.

06. සිතාරය වාදනය කරනුයේ "මිස්රාබ්" නම් උපකරණයෙනි. ( )

07. "සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන" ගීතය ළමා ගීයකි. ( )

08. "එගොඩ ගොඩෙත් රත්තරං"...... යන රබන් පදය මාත්‍රා හතරේ රිද්ම රටාවට අයත් ය. ( )

09. පාසල් ගීය හා ජාතික ගීය සීරුවෙන් සිට ගැයිය යුතු ය. ( )

10. ලඝු, ගුරු, ප්ලුත යනුවෙන් අක්ෂර වර්ග තුනකි. ( )

(ලකුණු 2 x 5 = 10)

- ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා, දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. නරිබෑණා නාට්‍යයේ සංගීත නිර්මාණය කළේ කවු ද?
    1. සුනිල් ශාන්ත මහතා ය.
    2. ලයනල් අල්ගම මහතා ය.
    3. W.D. අමරදේව මහතා ය.
    4. ආනන්ද සමරකෝන් මහතා ය.

12. දේශීය ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත හඳුන්වන්නේ කුමන නමකින් ද?

1. ළමා ගී
2. සරල ගී
3. තුන්සරණේ ගී
4. කෙළි ගී යනුවෙනි.

13. බෝවකින් හෙවත් අළුවකින් (Bow) වයන සංගීත භාණ්ඩ වනුයේ,

1. වයලින්, එස්රාජ්, දිල්රුබා ය.
2. වයලින් එස්රාජ් මැන්ඩලින් ය.
3. වයලින්, එස්රාජ්, ගිටාර් ය.
4. වයලින්, එස්රාජ්, තබ්ලා ය.

14. උච්ච ස්වර දක්වීම සඳහා........

1. ස්වරයට යටින් තිතක් තබයි.
2. ස්වරයට යටින් තිරස් ඉරක් අඳියි
3. ස්වරයට උඩින් තිතක් තබයි.
4. ස්වරයට උඩින් සිරස් ඉරක් අඳියි.

15. භාරතීය සංගීතයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ,

1. පෙරදිග හා අපරදිගයි.
2. පෙරදිග හා උතුරු ඉන්දීයයි.
3. අපරදිග හා දකුණු ඉන්දීයයි.
4. හින්දුස්ථානී හා කර්ණාටකයි.

16. ස්වර ස්ථාන නිවැරදිව ගායනය කිරීම සඳහා පුහුණු විය යුතු ගීත විශේෂය වනුයේ,

1. සරල ගීතයි.
2. ස්වර ස්ථාපන ගීතයි.
3. උපදේශාත්මක ගීතයි.
4. මව්පිය ගුණ ගීතයි.

17. "හර්මොනිකා" (Harmonica) යනුවෙන් හඳුන්වන සරල සංගීත භාණ්ඩය කුමක් ද?

1. රෙකෝඩර් ෆ්ලූට්
2. විද්‍යුත් ස්වර පුවරුව
3. මවුත් ඕගනය
4. මෙලෝඩිකාව

18. "සුවඳ පත්ම ඕලු ආදී" ගීතය අයත් නූර්ති නාට්‍ය කුමක් ද?

1. දුටුගැමුණු
2. විදුර
3. සිරිසඟබෝ
4. රාමායනය

19. ගුරු අකුරකට හිමි මාත්‍රා සංඛ්‍යාව කීය ද?

1. එකකි.
2. දෙකකි.
3. තුනකි.
4. හතරකි.

20. "සුරතල් නංගියෙ අපෙ අම්මා" "මිදුලේ වැලි මාලිගාවෙ" යන ගී අයත් ගී වර්ගය කුමක් ද?

1. මව්පිය ගුණ ගී
2. ස්වර ස්ථාපන ගී
3. කෙළි ගී
4. දේශාභිමානී ගී

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. කෙටි පිළිතුරු ලියන්න.

1. නූර්ති නාට්‍ය සංගීතයේ දී වාදනය කළ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය කුමක් ද?
2. ලඝු අකුරු තුනක වචනයක් ලියන්න.
3. "සීත ගඟුලෙදී ඇඳ පේවෙනවා" යන ගීතය අයත් ගැමි ගී විශේෂය කුමක් ද?
4. කොස්වතු කන්ද, මුං වතු කන්ද..... පිළිබඳ කියැවෙන කෙළි ගී විශේෂය කුමක් ද?
5. |කිරි|සුදු|හාs|වාs| ගීතය අයත් රිද්ම රටාවේ නම ලියන්න.
6. ප්ලුත අකුරට හිමි මාත්‍රා සංඛ්‍යාව කීය ද?
7. සිංගල් රීඩ්, ඩබල් රීඩ්, ත්‍රීසෙට් ආදී වශයෙන් නලා වර්ග ඇති සංගීත භාණ්ඩය කුමක් ද?
8. "Do" යනුවෙන් අපරදිග ගයන ස්වරය හඳුන්වන පෙරදිග ස්වරය කුමක් ද?
9. බුද්ධ, ............................, සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳව ............................ ගීත වලින් කියැවේ.
10. |x x x|x x x| මෙය ...................... තුනේ රිද්මරටාවට අයත් ය. මෙම ගී පාදය සඳහා ලඝු මාත්‍රා ........................ ක් ඇත.

(ලකුණු 12)

02. (i) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ ශුද්ධ ස්වර 7 ලකුණු කරන්න. (ලකුණු 07)

(ii) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පෙරදිග ස්වර නාම | | රිෂභය | ගාන්ධාරය | | පංචමය | | නිෂාධය |
| පෙරදිග ස්වර සංකේත | ස | | | ම | | ධ | නි |
| අපරදිග ස්වර සංකේත | C | D | E | F | | A | B |
| අපරදිග ස්වර නාම (ගායන) | | Re | Mi | | SO | La | |

(ලකුණු 05)

03. (i) ඔබ දන්නා ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

(ii) |1 2 3|1 2 3|1 2 3|1 2 3|

ඉහත මාත්‍රා තුනේ රිද්ම රටාවට තාලානුකූලව ගායනය කළ හැකි ස්වර රටාවක් නිර්මාණ කර ලියන්න. (ලකුණු 06)

04. (i) නරිබැණා නාට්‍යයේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) නරිබැණා නාට්‍යයේ චරිත 4 ක නම් ලියන්න (ලකුණු 04)

(iii) ඔබ උගත් නූර්ති නාට්‍ය ගීයක මුල් කොටස ලියන්න. (ලකුණු 04)

(iv) එම නූර්ති ගීය ඇතුළත් නාට්‍යයේ නම ලියන්න. (ලකුණු 01)

05. (i) පහත A සහ B කරුණු නිවැරදිව එකතු කරමින් වාක්‍යයක් ගොඩ නගා ලියන්න.

| A | B |
|---|---|
| එළුවන් කැම ගීතය | මේවර කෙළියේ ගීත ගයයි. |
| දොඩම් කපාලා ඇඹුල් තනාලා | කළගෙඩි සෙල්ලම රංගනයේ යෙදෙයි. |
| නැති වූ ආභරණයක් සොයමින් | "මේ වැල මොකද්දෝ" යනුවෙන් ඇරඹේ. |
| කාන්තාවන් විසින් ගමේ පෙරහැරේදී | ඔළිඳ කෙළියේ ගීයකි. |

(ලකුණු 08)

(ii) තුන්සරණේ ගීයක් ලියන්න. (ලකුණු 04)

06. (i) සංගීත භාණ්ඩ ඇසුරින් කෙටි පිළිතුරු ලියන්න.

1. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන ස්වර වාද්‍ය භාණ්ඩය කුමක් ද?
2. සිදුරු 7 කින් යුත් සුෂිර වාද්‍ය භාණ්ඩයකි.
3. තත් 8 කින් යුක්ත වුවද ස්වර 4 කට සුසර කරයි.
4. හින්දුස්ථානී සංගීතයේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩයයි.
5. ගසල්, භජන්, කව්වාලි ගායනවලදී බහුලව වාදනය කරන ස්වර වාද්‍ය භාණ්ඩයකි.
6. ප්‍රධාන තත "බාජ්කා තාර්" ලෙස හඳුන්වන සංගීත භාණ්ඩය කුමක් ද? (ලකුණු 06)

(ii) වයලින පවුලේ සාමාජිකයින් සේ සැලකෙන වාද්‍ය භාණ්ඩ හතරෙහි නම් ලියන්න. (ලකුණු 04)

(iii) බටනලා වර්ග දෙකකි, ඒවා නම් කරන්න. (ලකුණු 02)

07. (i) ඔබ පන්ති කාමරයේ දී සෑදූ ආදේශ භාණ්ඩයක නම ලියන්න. (ලකුණු 02)

(ii) එම ආදේශ භාණ්ඩය නිර්මාණය කිරීමට ඔබ විසින් යොදා ගත් ද්‍රව්‍ය මොනවා ද? (ලකුණු 04)

(iii) ආදේශ භාණ්ඩය සෑදූ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 06)